# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2019.05.28

වේලාව : ප.ව. 2.30

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත.

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :**

| | | | |
|---|---|---|---|
| **1)** | ප්‍රදීප් යසරත්න මහතා | - | ප්‍රධාන ලේකම් (බ.ප) |
| **2)** | පී. සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් |
| **3)** | හේමන්ත සමරකෝන් මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| **4)** | චන්ද්‍රානි සමරකෝන් මිය | - | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප) |
| **5)** | එස්.ජී.විජයබන්ධු මහතා | - | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප) |
| **6)** | එන්.නිල්වල මහතා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප) |
| **7)** | එච්.ජී.ජී.ජේ.ධර්මසේන මහතා | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| **8)** | ඩබ්ලිව්.එම්.දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| **9)** | සිරිසෝම ලොකුවිතානමහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| **10)** | එන්.බන්දුල ප්‍රේමකුමාර මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| **11)** | ඩී.එම්.එන්.දිසානායක මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| **12)** | ඩබ්ලිව්.එම්.ඩී.එන්.රණසිංහ මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| **13)** | පාලිතඅබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරි |
| **14)** | ආර්.එම්.දිනේෂා පී. කුමාරි මිය | - | සහකාර ලේකම්,ප්‍රවාහන අමාත්‍යාංශය (බ.ප) |
| **15)** | පේෂලාආර්. අබේසූරියමිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| **16)** | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

**ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ටඑළඹෙන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | පළාත් සහා නව ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම සම්බන්ධව | නව පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම් පිළිබඳ ව ප්‍රධාන ලේකම් විසින් ප්‍රගතිය විමසන ලදී.<br><br>එහි දී බොහෝ ආයතන විසින් අවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීම් සිදු කර ඇති බවත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මිල දී ගැනීම් කඩිනම් කරන ලෙසත්, ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br><br>එසේම, ප්‍රධාන ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර පුටු 350 ලබන සතිය වන විට කාර්යාලය වෙත ලැබීමට නියමිත බවත්, වමත් මේස සහ Lobby පුටු ජුනි මස 30 දින වන විට ලැබීමට නියමිත බවත්, නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 02. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආපන ශාලාවේ කටයුතු පවත්වාගෙන යාම | ආහාර පාන කමිටුව විසින් යෝජනා කරන ලද මිල ගණන් සඳහා එකඟතාවකට එළඹී බව නි.ප්‍ර.ලේ(පාලන) විසින්ප්‍රධානලේකම් දැනුවත් කරන ලදී.<br><br>එසේම, ආපන ශාලාව සම්බන්ධ චක්‍රලේඛය සති 2ක් ඇතුළත නිකුත් කිරීම සඳහා ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>කෘෂිකර්මඅමාත්‍යාංශයමඟින් පැවැත්වීමට නියමිත කෘෂි වෙළෙඳ කුටිය නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) ගේඅධීක්ෂණය මතකර්මාන්ත අධිකාරිය මඟින්ඉටු කරවා ගැනීමෙන් අනතුරුව 2019.06.15 දින වන විට විවෘත කිරීමට කටයුතු සූදානම් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින්දැනුම් දෙන ලදී. එසේම, ඒ සඳහා වියදම් වේ යැයිඅපේක්ෂිත ඇස්තමේන්තුකර ඇති ප්‍රතිපාදන කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබා දීමටත්, තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ප්‍රමුඛ ආහාර පාන කමිටුවේ සාමාජිකයින්<br><br>ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 03. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය සඳහා හදිසි විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීම | මේ සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ජුනි මස සිට හදිසි විමර්ශන ඒකකයේ කටයුතු ආරම්භ කරන බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | හදිසි විමර්ශන ඒකකයේ ප්‍රධානී |

| | | | |
|---|---|---|---|
| 04. | ආරක්ෂක විධි විධාන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් බස්නාහිර පළාත් සභාව සඳහාආරක්ෂක උපකරණ මිල දී ගැනීම. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආරක්ෂාව තර කිරීම සඳහා මිල දී ගැනීමට නියමිත උපකරණපිළිබඳව සාකච්ඡා කරන ලදී. එහි දී ලෝහඅනාවරකමේවනවිටමිලදීගෙනඇති බවත්,මාර්ග බාධක සහ කන්නාඩි මිල දී ගැනීම සඳහා පුවත්පත් දැන්වීම පල කිරීමේ කටයුතු සිදු වන අතර, පරිලෝකන උපකරණ තව මාස 1½ කින් ලැබීමට නියමිත බවත්, නි.ප්‍ර.ලේ (ඉංජිනේරු) විසින් ප්‍රකාශ කරන ලදී. මෙම උපකරණ කඩිනමින් මිල දී ගැනීමේ අවශ්‍යතාව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 05. | ගරු අමාත්‍යවරුන් විසින් භාවිතා කරන ලද වාහන සහ අනෙකුත් ඉන්වෙන්ට්‍රිගත උපකරණ සම්බන්ධව | ගරු අමාත්‍යවරුන් විසින් භාවිතා කරන ලද වාහනසම්බන්ධවකටයුතු කළ යුතු ආකාරය යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය මත ඉදිරි කටයුතු සිදු කරන ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br><br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින්, වාහන ලබා ගැනීම සඳහා මේ වන විට ඉල්ලීම් කර ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හාආයතන අතුරින් තෝරා ගත් ආයතන සඳහා තාවකාලික පදනම මත, අනෙකුත් ධුරධාරින්ගේ සහනිලධාරීන්ගේ වාහන ලබා දීම සඳහා කටයුතු කිරීමට ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>එතෙක්ඒ සඳහා රියදුරන් අනුයුක්ත කර තාවකාලික ක්‍රියාමාර්ග ලෙස වාහන පණගැන්වීමටත්, කෙටි දුර ප්‍රමාණයක් ධාවනයේ යෙදවීමටත් සිදු කළ යුතු බව වැඩිදුරටත් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු. |

<u>නව යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිල්ලේ බෞද්ධ සංගමයක් පිහිටුවීම. | මේ වන විට ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් පවත්වාගෙන යනු ලබන බෞද්ධ සංගමය, පළාත්සභා නව ගොඩනැගිලි පරිශ්‍රයේ සියලුනිලධාරීන් නියෝජනයවන පරිදි එක් සංගමයක් ලෙස පවත්වා ගෙන යාම සුදුසු බව තීරණය විය.<br><br>එසේම, සෑම පෝය දිනකටපෙර දින ධර්ම දේශනාමය පින්කමක්,මෙම ගොඩනැගිල්ලේ පිහිටා ඇති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවලින් සුදානම් කිරීම සුදුසු බවද යෝජනා වූ අතර, ඊට එකඟතාව ලැබිණි | බෞද්ධ සංගමයේ සභාපති - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 02. | “කරදියාන විවෘත බිම් පිරවීම සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ප්‍රකාශයට පත් කර ඇති වැඩි අවදානම් කලාපයේ හා අවදානම් කලාපයේ නැවත පදිංචි වීම හා අනවසර පදිංචි වීම් වලක්වාලීම” මැයෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂ විසින් යොමු කර ඇති ලිපිය [WP/WMA/T/P/16 (iii) හා 2019.05.02] | ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ලබා දී ඇති නිර්දේශ අනුව, අධි අවදානම් කලාපයේ පදිංචිකරුවන් ඉවත් කර බිම් පිරවීමේ ස්ථායිතාව වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු කරමින් සිටින බැවින්, සලකුණු කර ඇතිදැඩි අවදානම් කලාපයේ හා අවදානම් කලාපය තුල නැවත පදිංචි වීම සඳහා අවසර ලබා නොදීම පිළිබඳව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේඅධ්‍යක්ෂවිසින් යොමු කර ඇති ලිපිය සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින්කරුණු පැහැදිලි කරන ලදී.<br><br>එසේම,ප්‍රධාන ලේකම් විසින් මීතොටමුල්ලසිදුවීමට අදාල ව ජනාධිපති කාර්යාලයේ ලිපිය සම්බන්ධව විමසීමක් සිදු කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 03. | පෙර පාසල් ගුරු හවතුන් හට රු.5000ක මාසික දීමනාවක් ලබා දීම සඳහා සහා සම්මත පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සම්බන්ධ සාකච්ඡාවේ දී ගත් තීරණය සම්බන්ධව | බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීමේ දී ගරු පළාත් සභා මන්ත්‍රී ලලිත් එල්ලාවල මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද "බස්නාහිර පළාත තුල පූර්ව ළමාවිය මධ්‍යස්ථාන....." යෝජනාවට අදාළ ව බස්නාහිර පළාත තුල සිටින ලියාපදිංචි පෙර පාසල් ගුරුභවතුන් හට ලබා දීමට අදහස් කරන රු.5000.00ක මාසික දීමනාව සම්බන්ධව2019.05.09 දින ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී.<br><br>එහි දී මේ සඳහා රු.5000ක දීමනාවක් ගෙවීම ගැටළු සහගත වන බවත්, යම්කිසි නිර්ණායක මත පදනම්ව අවශ්‍යතාව පවතින තෝරා ගත්පෙර පාසල් සඳහා පමණක් වසරකට වරක්ඉගෙනුම් හා ඉගැන්වීමේ ආධාරක උපකරණ ලබා දීමේ ක්‍රමවේදයක් සැකසීම සුදුසු බවත් සාකච්ඡා කරන ලද අතර, අදාල තීරණය සභා ලේකම් වෙත දැන්වීමට කටයුතු සිදු කරන ලදී.<br><br>මෙවැනි දීමනා ලබා දීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බවත්, එවැනි ඉල්ලීම් අයවැය සකස් කරන අවස්ථාවේදී ඉදිරිපත් කිරීම සුදුසු බවත් නි.ප්‍ර.ලේ(මුල්‍ය) විසින් ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු සහ ආයතන ප්‍රධානින්. |
| 04. | 2019 වර්ෂය සඳහා විශේෂ ව්‍යාපෘති යෝජනා | 2019 වර්ෂය සඳහා බස්නාහිර පළාත්, පළාත් පාලන අමාත්‍යාංශය (මිලියන 562), මාර්ග අමාත්‍යාංශය (මිලියන 62) සහ අධ්‍යාපන අමාත්‍යාංශය (මිලියන 320) මඟින්යොමු කර ඇති ව්‍යාපෘති යෝජනා මීළඟ අයවැය යෝජනා සඳහා ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 05. | පළාත් සංවර්ධන ප්‍රදාන (PDG) වල ප්‍රගතිය සම්බන්ධව | මේ වන විට අනුමත කර ඇති ව්‍යාපෘති ලැයිස්තුව හා එහි වර්තමාන ප්‍රගතිය සම්බන්ධව විස්තර 2019.06.29 දින දහවල් 12.00 වන විට ලැබීමට සලස්වන ලෙස ප්‍රධාන ලේකම් විසින් ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 06. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියර සඳහා තෝරාගන්නා ලද ග්‍රාම නිලධාරි වසම්වල සංවර්ධන කටයුතු සඳහා පළාත් සභාවේ සහාය ලබා ගැනීම | ජනාධිපති කාර්යාලය මඟින් යොමු කරන ලද,ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියර යටතේ ලියාපදිංචි කර ඇති සමිතිවල සාමාජික පවුල් ආශ්‍රයෙන් කරන ලදසමීක්ෂණයකින් ඔවුන්ගේ ජීවන තත්ත්ව දර්ශක පිළිබඳ තොරතුරු නි.ප්‍ර.ලේ.(සැලසුම්) විසින්ප්‍රධාන ලේකම්වෙත ඉදිරිපත් කළ අතර, එම තොරතුරු අමාත්‍යාංශ වෙත යොමු කරන ලෙසත්, අවශ්‍ය උපරිම සහයෝගය ලබා දෙන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් දන්වා සිටින ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 07. | 2019.05.24 දින පවත්වන ලද ඩෙංගු මර්දන වැඩසටහනට අදාල ක්ෂේත්‍ර පරික්ෂණ වැඩසටහන සම්බන්ධව | ඩෙංගු මර්දන වැඩසටහනටසමගාමීව 2019.05.24 දින පවත්වන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වැඩසටහන ඉතා සාර්ථකව පවත්වන ලද බවත්,ඒ සඳහා සහභාගි නොවූආයතන සඳහා සිය අප්‍රසාදය පල කරන බවත්, ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | වැඩසටහන සඳහා සහභාගි නොවූ ආයතනවල ආයතන ප්‍රධානින් |
| 08. | පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ කටයුතු කරනු ලබන නීති ඒකකයේ කාර්ය මණ්ඩලය ප්‍ර/ලේ කාර්යාලයේ නීති ඒකකය සඳහා අනුයුක්ත කිරීම | ප්‍රධාන නීති නිලධාරි, පළාත් පාලන දෙපාර්තමේන්තුවේපරිපාලනමය කටයුතු වලින් නිදහස් කිරීමටත්, ඒ බව පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දීමටත් එසේම,පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ කටයුතු කරනු ලබන නීති ඒකකයේ කාර්ය මණ්ඩලය ප්‍රධාන ලේකම් නීති ඒකකය වෙත අනුයුක්ත කිරීමටත් තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br>ප්‍රධාන නීති නිලධාරි |
| 09. | ITRDA ආයතනය මගින් ප්‍රති වෛරස් මෘදුකාංග යාවත්කාලින වීමක් සිදු නොවන බැවින්, එය පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීම සම්බන්ධව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධව | මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා පහත නිලධාරින් හට 2019.05.29 දින පැමිණෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br>• නි.ප්‍ර.ලේ (පාලන)<br>• නි.ප්‍ර.ලේ (මුල්‍ය)<br>• නි.ප්‍ර.ලේ (ඉංජිනේරු)<br>• අධ්‍යක්ෂ, තො.තා.ස.සං. අධිකාරිය | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br>අධ්‍යක්ෂ, තො.තා.ස.සං.අධි. |
| 10. | “පළාත් සභා ගොඩනැගිල්ලේ පළමු මහලේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලීය අලෙවිසැලක් ආරම්භ කිරීම” මැයෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් යොමු කරන ලද ලිපිය | අදාල ලිපිය සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් තොරතුරු ඉදිරිපත් කළ අතර, එම ලිපියේ සඳහන් කර ඇති පරිදි අලෙවිසැල පවත්වාගෙන යාමේ දී අවශ්‍ය වන පහත සඳහන් කරුණු අතරින්‘අදාල ස්ථානයේ වම් පසින් විදුලි සැපයුමක්’ ලබා දීමට එකඟතාව පළ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 11. | අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ඇති යෝජනා අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙත යොමු කිරීම සම්බන්ධව | මේ වන විට බස්නාහිර පළාත් සභාව විසුරුවා ඇතත්, අදාල යෝජනා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට ඇති අමාත්‍ය මණ්ඩල යෝජනා අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු සහ ආයතන ප්‍රධානින්. |

| | | | |
|---|---|---|---|
| 12. | බඳවා ගැනීම් පටිපාටි සම්බන්ධව | බඳවා ගැනීම් පටිපාටිවල ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීමක් කඩිනමින් සූදානම් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු.) |

අත්/කළේ: ප්‍රදීප් යසරත්න,

ඩබ්ලිව්.එම්.දයාවතී,

ප්‍රධාන ලේකම්,

[illegible]